# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1997 අංක 19 දරන

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1997 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 3.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

## 1997 අංක 19 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින.]

එල්. ඩී.–ඕ. 26/96

### 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

1. මේ පනත 1997 අංක 19 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "විධානාත්මක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක්" යන වචන වෙනුවට, "විධානාත්මක අවම බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:– 1979 අංක 15 දරන පනතේ 303 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන පිළිවෙළින් 286අ, 308අ, 360අ, 360ආ, 360ඇ, 364, 364අ, සහ 365ආ වගන්තිවලට අදාළව 1, වන තීරයේ ඇතුළත් සටහන්වලට අනුරූපව 8 වන තීරයේ සටහන්වල දැක්වෙන "මහෙස්ත්‍රාත් අධිකරණය"යන වචන ඉවත් කිරීමෙන් ;

(2) 365 වන වගන්තියට අදාළව දක්වා ඇති සියලු ම සටහන් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :–

2–ඩී 042395–12,875 (96/11)

| | | | | |
|---|---|---|---|---|
| "365 | අස්වාභාවික වැරදි | එම එම එම එම | අවුරුදු දහයක් දක්වා වූ කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනා ගාරගත කිරීම සහ දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය"; |
| | අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් එම වරද සිදු කරන විටදී | එම එම එම එම | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ වන්දිය. | |

(3) 365අ වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| | | | | |
|---|---|---|---|---|
| "365අ | එක් තැනැත්තකු විසින් තවත් තැනැත්තකු සමග කරනු ලබන තදබල අශෝභන ක්‍රියා | එම එම එම එම | අවුරුදු දෙකක් දක්වා වූ කාලය කට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනා ගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය"; |
| | අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් එම වරද සිදු කරන විටදී | එම එම එම එම | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනා ගාරගත කිරීම සහ දඩය සහ වන්දිය.". | |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.